# ශිෂ්‍යත්ව ගමන




සෙනුන්දි නුලන්සා දිසානායක

# "ශිෂ්‍යත්ව ගමන "

2023 දෙසැම්බර්

**කතෘ**

සෙනුන්දි නුලන්සා දිසානායක

**කතාව සහ චිත්‍ර**

සෙනුන්දි නුලන්සා දිසානායක

**ISBN අංකය**

978-624-206-980-7

# පිදුම

මෙම කෘතිය ලිවීමට

උදව් උපකාර කළ

මාගේ ආදරණීය

අප්පච්චීට, අම්මාට සහ අක්කාටත්

මාගේ ආදරණීය

ගුරුවරුන්ටත්

ඉතා සෙනෙහසින් හා

ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් " දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණ අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# ශිෂ්‍යත්ව ගමන

මම ඉතා සතුටින් හතර ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණියට ආවා. පහේ පන්තියේ ගුරුතුමියත් ඉතාම හොඳයි. ඒදින මට එක පාරටම පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය මතක් වුණා.

පහේ පන්තියේ දී මම සිංහල, ගණිතය, පරිසරය වැනි විෂයන් හොඳින් ඉගෙන ගැනීමට අධිෂ්ඨාන කරගත්තා. මම පාසැලේදීත් නිවසේදීත් පාඩම් වැඩ හොඳින් කළා. ඒ වගේම නිවසේදී මම අමතර පොත් කියවීමෙන් දැනුම ලබාගත්තා.


Pastle

ඉතින් ඔහොම වැඩ කරගෙන යනකොට පාසැලේ ශිෂ්‍ය නායිකාවන් තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයට මා ඉදිරිපත් වුණා. අවසානයේදී මම පාසලේ ප්‍රාථමික අංශයේ ශිෂ්‍ය නායිකාවක් බවට පත් වුණා. ඉතා අලංකාර උත්සවයකින් අපට නිලලාංඡන පැළැන්දුවා.

ශිෂ්‍ය නායිකාවන්ට පාසලේ රාජකාරි පැවරුණා. නායිකාවන්ගේ වගකීම් අවබෝධ කරගෙන මම ඒ රාජකාරි හොඳින් ඉටු කලා. මම ගෙදරදි අප්පච්චි සමඟ අමතර පාඩම් වැඩ කළා. මාස කිහිපයක් යනකොට අන්තර් පාසැල් විවාද තරඟාවලියක් තිබෙන බව ගුරුතුමිය අපේ පන්තියට දැන්වූවා.

ඉතින් අපේ පන්තියේ මගේ යෙහෙළියන් කිහිපදෙනෙක් එයට ඉදිරිපත් වුවත් අවසානයේ දී අපේ පන්තියෙන් මම ඒ විවාද තරඟාවලියට සුදුසුකම් ලබාගත්තා.

මහනුවර මහ නගර සභාව විසින් පවත්වන එම විවාද තරඟාවලියට මාත් සමඟ සාමාජිකාවන් පස් දෙනෙක් සිටියා. අපි විවාදය සඳහා හොඳින් සූදානම් වුණා. මම අපේ පාසැලේ ප්‍රාථමික අංශයේ විවාද කණ්ඩායමේ නායිකාවද වුණා. මට හරිම සතුටුයි. විවාද තරඟාවලිය සඳහා දවස උදා වුණා. අපි අනෙක් කණ්ඩායම් සමඟ දක්ෂ ලෙස තරඟ කර, තෙවන ස්ථානය ලබාගත්තා. ලොකු උත්සවයකදී අපිට සහතික සහ මුදල් ත්‍යාග ලැබුණා. අපි සියලු දෙනාටම හරිම සතුටුයි.

අපේ පන්තිභාර තිලකා ගුරුතුමිය අපිට ඉතාම හොඳින් ඉගැන්වූවා. ගුරුතුමිය කියාදුන් පාඩම් මම හොඳින් සවන් දී ඒවා නැවත ගෙදර දී මතක් කරගත්තා. මගේ පන්තියේ හැමෝම වගේ මගේ යහළුවෝ. මම ඔවුන් සමඟ පාසලේ දී සෙල්ලම් කළා. ගෙදරදි මම අප්පච්චි දුන් වැඩද අතපසු නොකර කළා. මගේ සිහිනය වුණේ ලකුණු දෙසීයක් අරගෙන ශිෂ්‍යත්ව විභාගය ඉහළින් සමත් වීමයි.

චිත්‍ර ඇඳීමට මම ඉතාම කැමති. මම නිවසේදී චිත්‍ර ඇඳීමට අමතරව මගේ කුඩා බලු පැටියා හා පූසා සමඟ සෙල්ලම් කිරීමටද අමතක කරල නැහැ.

පාසලේදි කරන්න තිබෙන වැඩ මම කඩිසරව හා උන්නදුවෙන් කළා. මම දෙවන ශ්‍රේණියේ සිට මේස පන්දු ක්‍රීඩාව කළා. ක්‍රීඩාවේ පුහුණුවීම් සඳහා දිනපතා සහභාගී වුණා. මේස පන්දු තරගාවලි සඳහා ඉදිරිපත් වී මම ජයග්‍රහණ ලබාගත්තා.

2023 වර්ෂයේ මාර්තු මාසය වන විට මම පන්තියේ දක්ෂ ලෙස ඉගෙනීමේ කටයුතු කළා. ශිෂ්‍යත්ව විභාගය පැවැත්වෙන දිනය 2023-10-15 බව අපේ ගුරුතුමිය අපට දැන්වූවා. මම ප්‍රශ්න පත්‍ර කරන්න පටන්ගත්තා. පාසලේදී කරන ප්‍රශ්න පත්‍රවලට මට ලකුණු 85 ට වැඩියෙන් තිබුණා. මම රචනා ලිවීමට බොහෝ ප්‍රිය කළා.

මම පාසලේ බටහිර තූර්ය වාදක කණ්ඩායමේ සාමාජිකාවක් ද වුණා. පුංචි පුංචි නිර්මාණ කරන්නත් මම හරිම ආසයි. මම පාසලේ නිවේදන කටයුතුවලටත් සම්බන්ධ වුණා. අපේ පාසලේ පැවති විවිධ ප්‍රසංගය, භක්ති ගීත ප්‍රසංගය ආදිය සඳහා මා හට නිවේදන කටයුතු කිරීමට හැකිවීම මට විශාල සතුටක් ගෙන දුන්නා.

මම දවසක් අප්පච්චිට කිව්වා දළඹුවෙක් හොයලා ගෙනත් දෙන්න කියලා. අප්පච්චි මට දළඹුවෙක් ගෙනත් දුන්නා. මම එයාව බෝතලයකට දැම්මා. ටික දිනකින් එයා කෝෂයක් බවට පත් වුණා. තවත් ටික දවසකින් සමනලයෙක් ඉගිලිලා යනවා දැක්කා.

ඉතින් මම එහෙම තමා සමනලයෙක්ගේ ජීවන චක්‍රය ඉගෙන ගත්තේ.

කොහා හඬ නැගුවා. අප්‍රේල් මාසෙත් ආවා. අවුරුද්දට ගෙවල් සැරසුවා. රතිඤ්ඤා හඬ දසත පැතිරුණා. ක්‍රමයෙන් විභාගය ළඟ එන බව මට දැණුනා. දවසින් දවස මම කරන ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය වැඩි කළා. මම පාසලේ දී ප්‍රශ්න පත්‍ර දෙකම සඳහා ලකුණු 180 ඉක්මවා ලබාගත්තා.

ශිෂ්‍යත්ව විභාග ප්‍රශ්න පත්‍ර කොහොම වෙයිද කියලා මට ලොකු කුතුහලයක් තිබ්බා. කොහොම වුණත් වෙනදාටත් වඩා වැඩියෙන් මම පාඩම් කරන්න මම පටන්ගත්තා. අපේ ගුරුතුමිය කැපවීමෙන් අපව දිරිමත් කළා.

වෙසක් මාසේ, පොසොන් මාසේ අවසන් වෙලා ඇසළ මාසෙත් ආවා. මහනුවර ඇසළ පෙරහැරට මුළු නගරයම සූදානම් වුණා. ශිෂ්‍යත්ව විභාගය නිසා මම පෙරහැර බලන්න ගියේ නැහැ. මම හැමවිටම ප්‍රාර්ථනා කළේ ශිෂ්‍යත්ව විභාගය ලේසි වෙන්න කියලයි. එහෙම හිතුණු වෙලාවක අපේ ශිෂ්‍යත්ව විභාගය ඉක්මණින් ඉවර වුණා නම් කියලා මට එකපාරටම හිතුණා.

ශිෂ්‍යත්ව විභාගය නිසා මම මේස පන්දු ක්‍රීඩා පුහුණුවීම් නතර කළා. සැප්තැම්බර් මාසයත් ආවා. එන්න එන්නම මගේ උනන්දුව වැඩි වුණා. සෑම දිනකම මම පාසල් ගියා.

පාසලේදී ගුරුතුමිය දෙන ප්‍රශ්න පත්‍ර ඉතාමත් හොඳින් කළා. ඒ ප්‍රශ්න පත්‍රවලට ලකුණු 165, 170 වගේ ලබාගත් නිසා ගුරුතුමිය මම ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වන බවට මගේ සිතේ බලාපොරොත්තුවක් ඇති කළා. ඒ පුංචි බලාපොරොත්තුව මගේ සිතට තදින්ම දැණුනා.

ඔක්තෝබර් මාසයත් ආවා. "අනේ විභාගය තියන මාසය නේද?" කියලා සිතේ ලොකු බියක් ඇති වුණා. අපි ඔක්තෝබර් පළමු වැනිදා ළමා දිනයත්, ඔක්තෝබර් හයවැනිදා ගුරු දිනයත් සැමරුවා. එදින අපි සියලු දෙනාම සිංදු කියලා, නටලා, සෙල්ලම් කරලා ගොඩක් විනෝද වුණා.

ශිෂ්‍යත්ව විභාගය අත ළඟටම ආවා. මම ඉතාම හොඳින් පාඩම් කළා. ප්‍රශ්න පත්‍ර කළා. දින කිහිපයක් ගෙවී ගොස් ඔක්තෝබර් පහළොස් වන දිනය උදා වුණා.

"අද තමයි ශිෂ්‍යත්වය" කියා මට එකපාරටම කිය වුණා.

මම උදෙන්ම නැගිටලා ඇඳුම් ඇඳගෙන කෑම කාලා අප්පච්චිටයි, අම්මටයි වැඳලා ටිකක් බයෙන් වගේ පාසල වෙත ගියා. විදුහල්පති තුමිය අපිට ආශිර්වාද කළා. අපි අදාළ ආසනවල ඉදගත්තා.



මුලින්ම දෙවන ප්‍රශ්න පත්‍රය මට ලැබුණා. . "අනේ ඒක හරිම ලේසිනේ" කියාලා මට සෙමෙන් කිය වුණා. ඉන්පසු පළමු ප්‍රශ්න පත්‍රය ටිකක් අමාරු වුණා. නමුත් විභාගය කෙසේ හෝ සමත්වීමේ අරමුණින් මම හොඳින් පිළිතුරු ලිව්වා.

"ශිෂ්‍යත්වය ඉවරයි" කියාගෙන මම ඉතාම සැහැල්ලුවෙන් විභාග ශාලාවෙන් පිටතට දිවුවා.


"ශිෂ්‍යත්වය ඉවරයි"
"ශිෂ්‍යත්වය දැන් ඉවරයි"



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුල ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කරු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20